පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.07 පැය 1015 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 27 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

## පහරදී මුදල් කොල්ලකන ලද සැකකරුවන් හය දෙනෙකු අත්අඩංගුවට - දඹුල්ල පොලිස් ස්ථානය.

2025.01.04 වන දින දඹුල්ල පොලිස් වසමේ දඹුල්ල නගරයේදී කුලී රථ රියදුරෙකුට පහර දී මුදල් හා දේපල කොල්ලකෑම සම්බන්ධයෙන් දඹුල්ල පොලිස් ස්ථානයට කරන ලද පැමිණිල්ලක් මත විමශර්න සිදු කර 2025.01.05 වන දින මෙම සිද්ධියට සම්බන්ධ සැකකරුවන් හය දෙනෙකු දඹුල්ල පොලිස් ස්ථානය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 41 ත් 55ත් අතර වයස් වල පසුවන දඹුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පුද්ගලික කුලී රථ සේවා සපයන ආයතනයකින් මාගර්ගත ක්‍රමවේදය ඔස්සේ ලබා දුන් ගමන් වාරයක් අනුව, කටුනායක ගුවන්තොටුපළ වෙත විදේශිකයෙකු රැගෙන යාම සඳහා මෙම රියදුරු දඹුල්ල නගරය වෙත පැමිණ ඇති අතර විදේශිකයා කාර් රථයට නංවා ගැනීමෙන් පසු දඹුල්ල නගරයේ හයර් ලබා නොගන්නා ලෙසට සැකකරුවන් විසින් එම රියදුරුට තජර්නය කරමින් පහරදී ඔහු සන්තකයේ තිබූ රුපියල් 87,000 ක මුදලක් හා රුපියල් 15,000 ක් වටිනා උපැස් යුවලක් කොල්ලකා ඇති බවට විමශර්නයේදී අනාවරණය වී ඇත.

සැකකරුවන් 2025.01.06 වන දින දඹුල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2025.01.08 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**